# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**
**අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

## අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ ගොවිපල් කළමනාකරු, ව්‍යාප්ති නිලධාරි හා තාක්ෂණ නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරුවල 2024.12.31 දිනට පැවති පුරප්පාඩු පිරවීම සඳහා අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු අංකය* | *තනතුරු නාමය* | *මුළු පුරප්පාඩු සංඛ්‍යාව* | *සීමිත පදනම මත බඳවා ගැනීමට යෝජිත සංඛ්‍යාව (30%)* |
|---|---|---|---|
| 01 | ගොවිපල් කළමනාකරු | 09 | 03 |
| 02 | ව්‍යාප්ති නිලධාරි | 38 | 11 |
| 03 | තාක්ෂණික නිලධාරි | 05 | 01 |

02. 2025.03.25 දිනැති රා.ප.ච. අංක 10/2025 ප්‍රකාරව MN-3 2025 වැටුප් කේතය මෙම තනතුරට හිමි වන අතර, එයට අදාළ වැටුප් පරිමාණය, රු. 52,250-10X800-11X1,190-10X1,320-10X1,350-100,040 ක් වන අතර, එම වැටුප ඔබට හිමිවන්නේ **2027.01.01 දින සිටය.** පත්වීම ක්‍රියාත්මක දින සිට ඔබට මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

03. මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත්විය යුතු වේ. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයකට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

04. අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන විට අයදුම්කරුවන් පහත සඳහන් සියලුම අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අත්‍යාවශ්‍යය වේ.

*අධ්‍යාපන සුදුසුකම් :-*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය යන විෂයයනට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙ.) විභාගය විෂයන් හය (06) කින් සමත් වීම.

*වෘත්තීය සුදුසුකම් :*

I. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමාව;

*හෝ*

II. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව

*හෝ*

III. රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

IV. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**05.** **පළපුරුද්ද :**

ප්‍රාථමික හෝ ඉන් ඉහල සේවා ගණයක ස්ථිර, දෙපාර්තමේන්තුගත තනතුරක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක සක්‍රිය හා සතුටුදායක සේවා පළපුරුද්දක් තිබීම.

**06.** **කායික සුදුසුකම් :**

දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

**07.** **වෙනත් :**

1. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

2. සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

08. අයදුම් කළ යුතු ක්‍රමය :-

(අ) මෙම නිවේදනය අවසානයේ පළකර ඇති ආදර්ශ ආකෘතිය අනුව A4 (21cm x 29cm) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අංක 1 සිට 7 දක්වා ඡේද මුල් පිටුවට ද, ඡේද අංක 08, 09 දෙවන පිටුවට ද, අංක 10 සිට 12 දක්වා තෙවන පිටුවට හා අනෙකුත් ඡේද පිළිවෙලින් අනෙක් පිටුවලට ද ඇතුළත් වන පරිදි අයදුම්පත් පිළියෙල කළයුතු අතර ඊට අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. අයදුම්පත සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙනි.

(ආ) එක් අයදුම්කරුවෙකුට එක් තනතුරක් හෝ තනතුරු කිහිපයක් සඳහා අයදුම් කළ හැකි අතර ඒ සඳහා වෙන් වෙන්ව අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. ඉදිරිපත් කරනු ලබන අයදුම්පත්වල පැහැදිලිව තනතුරු සඳහා ඉල්ලුම් කරන ප්‍රමුඛතාවය පහත සඳහන් සංකේත අංක සහිතව සටහන් කළ යුතු ය. **එසේම අයදුම්කරනු ලැබූ තනතුරු මනාප අනුපිළිවෙල, පසුව වෙනස් කිරීමේ හැකියාවක් නොමැත.**

| *අනු. අංකය* | *තනතුර* | *සංකේත අංකය* |
|---|---|---|
| 1 | ගොවිපල් කළමනාකරු | 001 |
| 2 | ව්‍යාප්ති නිලධාරී | 002 |
| 3 | තාක්ෂණ නිලධාරී | 003 |

- නිදර්ශන

1 වන මනාපය ලෙස ව්‍යාප්ති නිලධාරී තනතුරද, 2 වන මනාපය ලෙස තාක්ෂණ නිලධාරී තනතුරද, 3 වන මනාපය ලෙස ගොවිපල් කළමනාකරු තනතුරද අයදුම් කිරීමට අපේක්ෂා කරන අයදුම්කරුවකු එම තනතුරුවලට අදාළ සංකේත අංක අයදුම්පත්‍රයේ 02 වගුවෙහි සංකේත අංකය යන තීරුවේ පහත පරිදි දැක්විය යුතු ය.

| *අනු. අංකය* | *මනාප ප්‍රමුඛතාවය* | *තනතුර* | *සංකේත අංකය* |
|---|---|---|---|
| 1 | 1 වන මනාපය | ව්‍යාප්ති නිලධාරී | 002 |
| 2 | 2 වන මනාපය | තාක්ෂණ නිලධාරී | 003 |
| 3 | 3 වන මනාපය | ගොවිපල් කළමනාකරු | 001 |

(ඇ) අයදුම්පත්‍ර පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද ලිවිය යුතු ය.

(ඈ) නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.06.08 දින හෝ ඊට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, 1095, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, ගැටඹේ, පේරාදෙණිය." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ විභාගයේ නම පැහැදිලිව සඳහන් කළ යුතු ය.

(ඉ) පහතින් දක්වා ඇති පරිදි අයදුම්කරන තනතුරු සංඛ්‍යාවට අනුව විභාග ගාස්තුවට අදාළව මුදල් ඇණවුමක් අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් නමින් පේරාදෙණිය තැපැල් කාර්යාලයෙන් මාරු කර ගත හැකි වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/ උප තැපැල් කාර්යාලයකින් ලබා ගෙන එම මුදල් ඇණවුම අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතු ය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදු නොකරන බව ද කාරුණිකව දන්වමි. විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනයම් හේතුවක් මත ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ සිදු කරනු නොලැබේ.

| *අයදුම්කරන තනතුරු සංඛ්‍යාව* | *විභාග ගාස්තුව* |
|---|---|
| ගොවිපල් කළමනාකරු හා/ හෝ ව්‍යාප්ති නිලධාරී තනතුර සඳහා | රු. 1,000.00 |

| *අයදුම්කරන තනතුරු සංඛ්‍යාව* | *විභාග ගාස්තුව* |
|---|---|
| තාක්ෂණ නිලධාරී තනතුර සඳහා | රු. 1,000.00 |
| ගොවිපල් කළමනාකරු හා/ හෝ ව්‍යාප්ති නිලධාරී තනතුර සහ තාක්ෂණ නිලධාරී තනතුර සඳහා | රු. 1,150.00 |

(ඊ) මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර, සෑම ආකාරයකින් ම සම්පූර්ණ නොවන හා ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්‍ර පූර්ව දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලබන අතර, තැපෑලේ දී සිදුවන නැතිවීම් හා ප්‍රමාදවීම් පිළිබඳව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ. එබැවින්, අයදුම්පත්‍ර යොමු කිරීමට ප්‍රථම විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත් කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර ඇති ද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තු ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට මුදල් ඇණවුම අලවා ඇත්ද යන්න පිළිබඳවත් නැවත විමසිලිමත් වන ලෙස දන්වමි. තවද, සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ මුදල් ඇණවුමෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශපත්‍රයේ ද අයදුම්කරුගේ ආදර්ශ අත්සන සහතික කර තිබිය යුතු අතර තම ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරුවන් තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කර තිබිය යුතු ය.

- **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් -** අයදුම්පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු පමණක් සැපයිය යුතු ය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු බවට අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

  අපේක්ෂකයෙකු විසින් සපයන ලද තොරතුරු පසු කලකදී වැරදි බව පෙනී ගියහොත් හෝ ඔහු/ ඇය විසින් හිතාමතාම කිසියම් කරුණක් වසන් කරන ලද බව හෙළි වුවොත් හෝ ඔහුට/ ඇයට තවදුරටත් පත්වීමක් ලබාදීම සම්බන්ධයෙන් සලකා බලනු නොලබන අතර, මෙම විභාගය හේතු කොටගෙන දී තිබූ පත්වීමක් අහෝසි කිරීමට හෝ රජයේ සේවයෙන් පහ කිරීමට වුවද යටත් වේ.

09. *විභාග පරිපාටිය :-*

(අ). විභාග නිවේදනය අනුව සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකර ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. සුදුසුකම් සම්පූර්ණ කර නොමැති අයදුම්පත් පෙර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අපේක්ෂකයකු විභාගය සඳහා පෙනී සිටීමේදී තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන කිසිදු අයදුම්කරුවකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය මහනුවරදී පමණක් පැවැත්වේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව **සඳහන් කරමින් නිවේදනයක් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වන www.dea.gov.lk මගින් පළකරනු ඇත.**

විභාග ප්‍රවේශ පත්‍ර, විභාගය පැවැත්වීමට දින 14 කට පෙර අයදුම්කරුවන්ගේ අයදුම්පතේ සඳහන් දුරකතන අංකය වෙත කෙටි පණිවිඩයක් (SMS) මගින් හෝ අයදුම්පතේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත විද්‍යුත් තැපැල මගින් යොමු කරනු ලැබේ.

(ඇ) නිවේදනය පළවී දින 04 ක් 05 ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. (දුරකථන අංකය 0812068381)

(ඈ) පහත සඳහන් තොරතුරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(i). විභාගයේ නම ;
(ii). අපේක්ෂක/අපේක්ෂිකාවගේ සම්පූර්ණ නම ;
(iii). ලිපිනය ;
(iv). ඉල්ලුම්පත්‍රය ලියාපදිංචි කළ දිනය, ලියාපදිංචි කළ තැපැල් කාර්යාලය හා අංකය ;
(v). විභාග ගාස්තු ගෙවූ මුදල් ඇණවුමේ අංකය, දිනය හා තැපැල් කාර්යාලය.

(ඉ). විභාගයට පෙනී සිටීම වෙනුවෙන් අපේක්ෂක/ අපේක්ෂිකාවන්ට දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් කිසිදු දීමනාවක් ගෙවනු නොලැබේ.

(ඊ). *අනන්‍යතාවය.-* තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාවය සනාථ කළ යුතු ය. මේ සඳහා,

(i). පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත; හෝ
(ii). වලංගු විදේශ ගමන් බලපත්‍රය; *හෝ*
(iii). වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය පිළිගැනේ.

විභාග අපේක්ෂකයන් සිය අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි ඉලෙක්ට්‍රොනික සන්නිවේදන උපාංග පැළඳගෙන නොමැති බව සනාථ කිරීම සඳහා මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය තහවුරු කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් හට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(උ). **විෂයය නිර්දේශය :-**

ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු දෙකම සඳහා පැවැත්වෙනුයේ එක් පොදු පරීක්ෂණයක් පමණි.

| *විෂයය අංකය* | *විෂයය* | *කාලය පැය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* | *අදාළ වන තනතුර* |
|---|---|---|---|---|---|
| 01 | බුද්ධි පරීක්ෂණය | 1 | 100 | 40% | සියලුම තනතුරු සඳහා |
| *විෂයය අංකය* | *විෂයය* | *කාලය පැය* | *උපරිම ලකුණු* | *සමත් ලකුණු* | *අදාළ වන තනතුර* |
| 02 | පොදු පරීක්ෂණය I (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 3 | 100 | 40% | ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා |
| 03 | පොදු පරීක්ෂණය II (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | 3 | 100 | 40% | තාක්ෂණ නිලධාරී තනතුර සඳහා |

(i). **බුද්ධි පරීක්ෂණය :- (සියලුම තනතුරු සඳහා අදාළ වේ)**

අපේක්ෂකයාගේ, තර්කානුකූලව හා විශ්ලේෂණාත්මකව සිතීමේ හැකියාවත්, තීරණ ගැනීමේ ශක්තියත් නිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.
**පොදු පරීක්ෂණය I (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) :- (ගොවිපල් කළමනාකරු හා ව්‍යාප්ති නිලධාරී තනතුරු සඳහා අදාළ වේ)**

- සාමාන්‍ය කෘෂිකර්මය හා මූලධර්ම
- බෝග නිෂ්පාදනය හා මූලධර්ම ශෂ්‍ය විද්‍යාත්මක කරුණු
- පස හා පොහොර, ශාක පෝෂණය, පාරිසරික බලපෑම්
- බෝග ප්‍රචාරණ ක්‍රම
- රෝග හා පළිබෝධකාරකයන්, ලක්ෂණ හා හානි
- කෘෂිකාර්මික ප්‍රතිපත්ති, අතීත, වර්තමාන හා අනාගත විභවයන්
- අපනයන කෘෂිකර්ම බෝග, ගම්මිරිස්, කුරුඳු, කෝපි, කොකෝවා, කරදමුංගු, කරාබු, සාදික්කා, බුලත්, පුවක්, වැනිලා සහ අනෙකුත් බෝගවලට අදාළ උද්භිද විද්‍යාත්මක කරුණු, දේශගුණික සාධක, පොහොර බලපෑම හා පෝෂණය, රෝග හා පළිබෝධ පසු අස්වනු තාක්ෂණය
- අපනයන බෝග අලෙවිය සහ අපනයන විභවයන්
- කාබනික ගොවිතැන
- ගොවිපල පාලනය, පැළ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය හා තවාන් පාලනය හා කාබනික ගොවිතැන
- කෘෂිකර්ම ව්‍යාප්ති ක්‍රම හා ව්‍යාප්තිවේදය

(ii). **පොදු පරීක්ෂණය II (තාක්ෂණ හා විෂයානුබද්ධ පොදු පරීක්ෂණය) :- (තාක්ෂණ නිලධාරී තනතුර සඳහා අදාළ වේ)**

- කෘෂිකාර්මික මූලධර්ම
  - ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප හා බෝග නිෂ්පාදනය කෙරෙහි ඒවායේ බලපෑම
  - පස් වර්ග, පාංශු සංරක්ෂණය, ශාක පෝෂණය හා ජල සංරක්ෂණය
  - පළිබෝධ හඳුනා ගැනීම, වර්ගීකරණය හා මර්දනය
  - ශාක ප්‍රචාරණය, තවාන් පාලනය හා පටක රෝපණය
  - කෘෂිකර්මය හා පරිසරය
  - වතු වගාව, ක්ෂේත්‍ර බෝග වගාව, මිශ්‍ර බෝග වගාව හා කෘෂි වන වගාව
  - පසු අස්වනු තාක්ෂණය
  - අපනයන කෘෂි බෝග අර්ථ දැක්වීම, ප්‍රචාරණය, ක්ෂේත්‍ර ස්ථාපනය, නඩත්තුව, රෝග පළිබෝධ පාලනය හා අස්වනු සැකසීම
  - ගොවිපළ පාලනය හා සැලසුම් කිරීම
- ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්ත සංවර්ධනය හා සම්බන්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතන එකිනෙකෙහි දායකත්වය
- රසායනාගාර උපකරණ හඳුනා ගැනීම, ප්‍රයෝජනය හා පිරිසිදු කිරීම සහ රසායනික ද්‍රව්‍ය ආරක්ෂිතව පරිහරණය, ගබඩා කර තැබීම

(ඌ). මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන අතර, විභාගයට පෙනී සිටින අපේක්ෂකයන් අදාළ සියලුම ප්‍රශ්න පත්‍ර සඳහා එකම භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතු ය. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. *සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i). තෝරාගනු ලබන අපේක්ෂක/ අපේක්ෂිකාවන් දිවයිනේ කවර ප්‍රදේශයක දී වුව ද, සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

(ii). මෙම තනතුරට පත් කරනු ලබන්නන් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වනු ඇත.

(iii). එක් තනතුරකට බඳවා ගත් පසු වෙනත් තනතුරකට මාරුවීමට ඉඩදෙනු නොලැබේ.

11. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

ලිඛිත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබා ගත් අපේක්ෂකයන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට තුන් ගුණයකට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේ දී ලබා ගත් මුළු ලකුණුවල කුසලතා අනු පිළිවෙල මත බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. සියලුම බඳවා ගැනීම් නිම කිරීමෙන් අනතුරුව අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත තමා විභාගයේ දී එක් එක් විෂයයට ලබාගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබාදීම සිදු කරනු ඇත.

12. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම හා අයදුම්කරු විභාගයට ඉදිරිපත් වීම හෝ මෙම තනතුරට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් පත්වීම් ලැබීමට නුසුදුස්සකු සේ සලකා ක්‍රියා කරනු ලැබේ.

13. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධ පත්වීම් බලධාරියා වන අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

14. විභාගය පැවැත්වීමේ දී හා ප්‍රතිඵල නිකුත් කිරීමේ දී මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඇයට හෝ ඔහුට සිදුවනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**එම්.කේ.එස්.ආර්.ඩී.සමරසිංහ,**
අපනයන කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්.

2026 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින.